## බළන්ගොඩ නගර සභාව

## 2026.03.10 වන දිනැති මහා සභා රැස්වීම් වාර්තාව

**ස්ථානය** **- බළන්ගොඩ නගර සභා රැස්වීම් ශාලාව**

**දිනය** **- 2026.03.10**

**වේලාව** **-පෙ.ව. 10.00**

**බළන්ගොඩ නගර සභාවේ ගරු සභාපතිතුමන්ගේ ප්‍රධානත්වයෙන් මෙදින මහ සභාවේ කටයුතු පවත්වන ලදී.**

**සහභාගීත්වය**

| | |
|---|---|
| 1. ගරු සභාපති | එන්.ඩබ්.පී.ටී ජයසේන මැතිතුමා |
| 2. ගරු නාගරික මන්ත්‍රී | ඩබ්.ඒ.වසන්ත ගුණරත්න මැතිතුමා |
| 3.ගරු නාගරික මන්ත්‍රී | කේ.ජී පේමදාස මැතිතුමා |
| 4. ගරු නාගරික මන්ත්‍රී | එම්.ටී.එම් රූමි මැතිතුමා |
| 5. ගරු නාගරික මන්ත්‍රී | එම්.නිමල් කරුණාරත්න මැතිතුමා |
| 7. ගරු නාගරික මන්ත්‍රී | එම්.ඩබ්.විමලසිරි මැතිතුමා |
| 8. ගරු නාගරික මන්ත්‍රී | නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා |
| 9.ගරු නාගරික මන්ත්‍රිනී | සුනේත්‍රා ඩී.වීරසිංහ මැතිතුමිය |
| 9. ගරු නාගරික මන්ත්‍රිනී | පී.කේ.එන්.ටී.ඩී සමරසේකර මැතිතුමිය |
| 10. ගරු නාගරික මන්ත්‍රී | ජී.ජී.ජී.එන් සේනාරත්න මැතිතුමා |
| 11. ගරු නාගරික මන්ත්‍රී | එස්.යූ.සී. ජයනක මැතිතුමා |
| 12. ගරු නාගරික මන්ත්‍රී | එච්.ඒ.එච්.එන්. හෙට්ටිආරච්චි මැතිතුමා |
| 13. ගරු නාගරික මන්ත්‍රී | ඩබ්.එම්.එම්.බී.බණ්ඩාර මැතිතුමා |
| 14. ගරු නාගරික මන්ත්‍රී | ඩබ්.ඩී. වසන්ත කුමාර මැතිතුමා |

**නිළධාරි සහභාගීත්වය**

| | |
|---|---|
| 1. ලේකම් | එස්. එච්. ඒ. කරුණාරත්න මිය |

**01.පසුගිය 2026.02.25 දිනැති මහ සභාවේ සහ 2026.02.16 දිනැති විශේෂ මහ සභාවේ සභා වාර්තා සම්මත කිරීම.**

මෙදින මහ සභාවේ වැඩ කටයුතු ආරම්භ කළ ගරු සභාපතිතුමා, ආගම සිහි කිරීමෙන් අනතුරුව සභාව සඳහා සහභාගි වූ ගරු මන්ත්‍රී මණ්ඩලය, ලේකම්තුමිය ඇතුළු කාර්ය මණ්ඩලය හා මාධ්‍යවේදීන් ඇතුළු සියළුදෙනා පිළිගන්නා ලදී.

ඉන් අනතුරුව 2026-02-25 දිනැති මහා සභා වාර්තාව සහ 2026-02-16 දිනැති විශේෂ මහ සභා වාර්තාව සංශෝධනයන්ට යටත්ව සත්‍යය වාර්තා බවට සභා සම්මත කර ගන්නා ලෙස පවසා සිටින ලදී.මෙහි දී ගරු නාගරික මන්ත්‍රී ඩබ්.එම්.එම්.බණ්ඩාර මැතිතුමා විසින් 2026-02-25 දිනැති මහා සභා වාර්තාව සහ 2026-02-16 දිනැති විශේෂ මහ සභා වාර්තාව සංශෝධනයන්ට යටත්ව සත්‍යය වාර්තා බවට යෝජනා කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී එම්.ටී.එම් රූමි මැතිතුමා විසින් එකී යෝජනාව ස්ථිර කරන ලදී.

අනතුරුව ගරු සභාපතිතුමා විසින් සභා වාර්තාවල සංශෝධනයන් තිබේදැයි විමසූ අතර, ගරු නාගරික මන්ත්‍රී කේ.ජී ප්‍රේමදාස මැතිතුමා සඳහන් කලේ පසුගිය 2026-02-25 දිනැති මහ සභා වාර්තාවේ පිටු අංක 06හි කල් දී ඇති ප්‍රශ්න අංක 06:02:01 හි ගරු සභාපතිතුමා ලබා දුන් පිළිතුරෙහි "සභාවට අයත් අනෙකුත් සුසාන භූමි දෙකම මනාව නඩත්තු වුවද " යන්න "සභාවට අයත් අනෙකුත් සුසාන භූමි හතරම නඩත්තු වුවද " ලෙස සංශෝධනය විය යුතු බව පවසන ලදී.

**2026-02-25 දිනැති මහ සභාවේ සහ 2026-02-16 දිනැති විශේෂ මහ සභාවේ සභා වාර්තා සංශෝධනයන්ට යටත්ව ගරු සභාවේ ඒකමතිකව සභා සම්මත විය.**

**02.** **ගරු සභාපතිතුමන් විසින් කරනු ලබන නිවේදන**

- ❖ ගරු සභාපතිතුමන් විසින් නිවේදන වාරය ආරම්භ කරමින් පැවසුයේ නගර සභා බල ප්‍රදේශය තුළ මත්ද්‍රව්‍ය නිවාරණ වැඩසටහනක් පැවැත්වීම වෙනුවෙන් නාගරික මන්ත්‍රී කණ්ඩායම සමඟ සාකච්ඡාවක් මාර්තු 04 වන දින පැවැත්වීමට සූදානම් කරන ලෙස දැනුම් දෙමින් මත්ද්‍රව්‍ය නිවාරණ මධ්‍යස්ථානය මඟින් යොමු කර ඇති ලිපිය සභාගත කරන ලදී.

**03.** **සභා රැස්වීමට නොපැමිණ සිටීමේ අවසරය සඳහා වන යෝජනා**

අසනීප තත්ත්වයක් හේතුවෙන් ගරු නාගරික මන්ත්‍රී එම්.ජුනයිදීන් මලීක්ෂා මැතිතුමා සහ ගරු නාගරික මන්ත්‍රී එන්.ඒ.එස් චන්දන මැතිතුමා 2026-03-10 දින මහ සභාවට සහභාගී නොවන බවත්, නිවාඩු අනුමත කර දෙන ලෙසත් යොමු කරන ලද ඉල්ලීම් අනුව ගරු සභාපතිතුමන්

විසින් එතුමන්ලාගේ නිවාඩු අනුමත කරන ලෙසට කළ යෝජනාව ගරු නාගරික මන්ත්‍රී කේ.ජී.පේමදාස මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.ඒ අනුව එකී නිවාඩු ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.

**04. සංදේශ/පැමිණිලි/පෙත්සම්/ආයාචනා ඉදිරිපත් කිරීම**

❖ බළන්ගොඩ ප්‍රදේශයට කීර්තියක් ගෙන දුන් ප්‍රවීණ පාපැදි ශූරයෙකු වන නාගරික මන්ත්‍රී නිමල් කරුණාරත්න මැතිතුමාට උපහාර පිණිස බළන්ගොඩ තරුණ එකමුතුව සහ බළන්ගොඩ පාසල් ආදිශිෂ්‍ය එකමුතුව එක්ව සංවිධානය කරන පාපැදි සවාරියක් 2026.04.11 දින පැවැත්වීමට බළන්ගොඩ නගර සභාවේ සහයෝගය ලබා දෙන ලෙස බළන්ගොඩ තරුණ එකමුතුවේ සභාපති යොමුකර කර ඇති ලිපිය ගරු සභාපතිතුමන් විසින් සභාගත කරන ලදී.

❖ දොරවෙල ඇළ මාර්ගයට මායිම්ව පිහිටා ඇති ඉඩම්වල ඉවුරු ඛාදනය වීමෙන් ඇතිවෙන පරිසර හානිය හා එමඟින් එම ඉඩම් සේදීයාම වළක්වා ගැනීම වෙනුවෙන් දැල සහිත ගල් ආවරණය (ශ්‍රේබියන් වෝල්) ඉදිකර ගැනීම සඳහා වන එල්.ටී.එච් චන්ද්‍රලාල් සහ එල්.ටී.එච් හේමචන්ද්‍ර යන ඉඩම් හිමියන් යොමුකර ඇති ලිපිය ගරු සභාපතිතුමන් විසින් සභාගත කරන ලදී.

මෙහිදී අදහස් දැක්වූ ගරු සභාපතිතුමන් පැවසුයේ මෙම ස්ථානයේ ස්ථානීය පරීක්ෂාවක් සිදුකළ බවත්, නාගරික සංවර්ධන අධිකාරිය මඟින් මේවන විටත් දොරවෙල ඟග දෙපස බැම්මක් සකස් කිරීමට සැලසුම් සකස් කර ඇති බවත්, එම නගර සැලැස්මට අනුකූල වන පරිදි සැලසුම් කමිටුවට සැලසුමක් ඉදිරිපත් කර අනුමැතිය ලබාගෙන ඉදිරි කටයුතු සිදු කළ යුතු බවයි.

ගරු නාගරික මන්ත්‍රී ඩබ්.ඒ වසන්ත ගුණරත්න මැතිතුමා සඳහන් කලේ මාර්ග සංවර්ධන අධිකාරියද මෙයට සම්බන්ධ කරගත යුතු බවත්, ඉහත ස්ථානයේ දොරවෙල ඔය අයත් වන රක්ෂිත කොටසක් පවතින බවත්, එම කොටසත් සමඟ අයිති කර ගැනීමට සහ ඉදිරියේදී යම් යම් දේ සිදුකරගැනීමට මෙම ඉල්ලීම මඟින් බලාපොරොත්තු වන බවත්, මීන් පෙර සභාවන්වලටද මෙම ඉල්ලීම් පැමිණි බවත් නමුත් අවස්ථාව ලබා නොදුන් බවත්, ඉවුරු ඛාදනය ගංවතුර කාලවලදී උපරිම සිදු වන බවත්, ඊට අවශ්‍ය ගැඹුර ඒ අනුව පැවතිය යුතු බවත්, එම පුද්ගලයාට අවශ්‍ය ආකාරයට සකස් කිරීමට ඉඩ නොදී නියමිත තාක්ෂණික ක්‍රමවේදය කාර්මික නිලධාරී මහත්වරු මඟින් ලබා ගත යුතු බවත්ය.

ගරු නාගරික මන්ත්‍රී ඩබ්.එම්.එම්.බී බණ්ඩාර මැතිතුමා පැවසුයේ ඉහත ස්ථානයේ ඉදිරියේදී යම් ඉදිකිරීමක් සිදු කරනනවාද යන්න පිළිබඳව විමසීමක් සිදු කළ යුතු බවත්, එවැනි ඉදිකිරීමක් කරන්නේ නම් ඊට අදාළ බැම්ම ඉදිකිරීමට අවස්ථාවක් ලබාගන්නවාද යන්න පිළිබඳවත් සොයා බැලිය යුතු බවත්ය.

**05.ටෙන්ඩර්පත් හා මිල ගණන් විවෘත කිරීම.**

අදදින ටෙන්ඩර්පත් නොමැති බව ගරු සභාපතිතුමා පවසන ලදී.

**06. කල් දී ඇති ප්‍රශ්න**

**06:01 ගරු නාගරික මන්ත්‍රීනි සුනේත්‍රා වීරසිංහ මැතිතුමිය**

**06:01:01** බළන්ගොඩ නගරයේ බස් නැවතුම්පල වැසිකිළි පද්ධතියේ මේ වන විට තත්වය කෙසේද? ඉහත ප්‍රශ්නයට පිළිතුරු ලබා දෙමින් ගරු සභාපතිතුමා පැවසුයේ මීට පෙර ආරම්භ කිරීමට නියමිතව තිබූ ව්‍යාපෘතියක් බවත්, වර්තමාන රජයේ Clean Sri Lanka ව්‍යාපෘතිය යටතේ බළන්ගොඩ නගරයේ බස් නැවතුම්පල වැසිකිළි පද්ධතිය නවීකරණය කිරීමේ ව්‍යාපෘතිය සඳහා අවස්ථාව ලැබුන බවත්, දැනට එම ව්‍යාපෘතිය ආරම්භ කර ඇති බවත්, කාන්තා සහ පිරිමි වැසිකිළි පද්ධති දෙකම එකවර වැඩ ආරම්භ කර ඇති බවත්, පොදු ජනතාව වෙනුවෙන් තාවකාලිකව බස් නැවතුම්පොළ උඩු මහලේ වැසිකිළි පහසුකම් ලබා ගැනීමේ අවස්ථාව සලසා ඇති බවත්, 2026-03-31 දින වන විට වැඩ අවසන් කළ යුතුව පවතින නමුත් ප්‍රසම්පාදන ක්‍රියාවලියට අදාළව විරෝධතා ගොනු කිරීම හේතුවෙන් ව්‍යාපෘතිය ආරම්භ කිරීමේ යම් දින ප්‍රමාදයක් සිදුවූ බැවින් එදිනට වැඩ අවසන් කිරීම පිළිබඳව ගැටළුවක් වී ඇති බවත්, නමුත් එදිනට වැඩ අවසන් කිරීමට අවශ්‍ය කටයුතු සිදු කරන බවත්ය.

**07. කල් දී ඇති යෝජනා**

**07:01 ගරු සභාපති එන්.ඩබ්.පී.ටී.ජයසේන මැතිතුමා**

**07:01:01** බළන්ගොඩ නගර සීමාව තුල කසළ එකතු කිරීමේ ටෙන්ඩරය සඳහා පහත ගෙවීම් සිදු කිරීම වෙනුවෙන් ආවරණ අනුමැතිය ලබා ගැනීම.

2026.01.01 දින සිට 2026.01.15 දින දක්වා රු.625,000.00

2026.01.16 සිට 2026.01.31 දින දක්වා රු.625,000.00

2026.02.01 සිට 2026.02.15 දක්වා රු.625,000.00

2026.02.16 සිට 2026.02.28 දක්වා රු.625,000.00

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් යෝජනා කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී ඩබ්.ඒ වසන්ත ගුණරත්න මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**ඒ අනුව විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**07:01:02** බලන්ගොඩ නගර සභාවට අයත් සුසාන භූමි 02 නඩත්තු කටයුතු සිදු කරන භාරකරුවන් සඳහා ලබා දෙන රු.15000.00ක දීමනාව ප්‍රමාණවත් නොවන බැවින් දීමනාව වැඩිකර දෙන ලෙස කරන ලද ඉල්ලීම සඳහා ඉදිරි කටයුතු තීරණය කිරීම.

මෙහිදී ඉහත යෝජනාව පිළිබඳව අදහස් දැක්වූ ගරු සභාපතිතුමන් පැවසුයේ ඉහත ඉල්ලීම පසුගිය සභා වාරයකදී සංදේශ පැමිණිලි යටතේ ඉදිරිපත් වූ බවත්, එහිදී සාකච්ඡා වූයේ සුසානභූමි භාරකරු දීමනාව රු.20,000ක් දක්වා වැඩි කිරීමට බවත්, යෝජනා යටතේ ඉදිරිපත් කර නීත්‍යානුකූලව තීරණයක් ගැනීමට ඉදිරිපත් කළ බවත්, දැනට සුසාන භූමි භාරකරුවන් දෙදෙනෙකුගෙන් ඉල්ලීම් පැමිණ තිබුනද ඉදිරියේදී බුලත්ගම සුසානභූමියටද භාරකරුවෙකු යොදවන බැවින් පොදුවේ තීරණයක් ගත යුතු බවත්ය.

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් යෝජනා කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී කේ.ජී පේමදාස මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

ගරු නාගරික මන්ත්‍රී එම්.ටී.එම් රුමී මැතිතුමා පැවසුයේ බුලත්ගම සුසානභූමි භාරකරු පත් කිරීමෙන් අනතුරුව එය සභාවට යොමුකර අනුමැතිය ලබා ගැනීම සුදුසු බවත්, දැනට සභාව විසින් පත්කර ඇති සියළුම සුසානභූමි භාරකරුවන් සඳහා දීමනාව රු.20,000 ක් දක්වා වැඩි කිරීම සුදුසු බවට යෝජනා කරන බවත්ය.ගරු නාගරික මන්ත්‍රී එච්.ඒ.එච්.එන් හෙට්ටිආරච්චි මැතිතුමා එකී යෝජනාව ස්ථිර කරන ලදී.

**ඒ අනුව විරෝධතා නොවූ හෙයින් ඉහත සංශෝධිත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**07:01:03** කඩකාමරවල බදු අයිතිය සංශෝධනය කිරීම සම්බන්ධයෙන් පළාත් පාලන කොමසාරිස්තුමාගේ අංක CLG/LG/5/3/1- (IV වෙළුම) හා 2026.01.01 දිනැති ලිපියේ උපදෙස් අනුව බලන්ගොඩ නගර සභාවට අයත් අතුරු බදු ලබා දී ඇති කඩ කාමර වල බදු අයිතිය අතුරු බදුකරුගේ නමින් සංශෝධනය කිරීම සඳහා අනුමැතිය ලබා ගැනීම.

| අනු අංකය | කඩ කාමර අංකය | ගිවිසුම්ගත බදුකරුගේ නම | අතුරු බදුකරුගේ නම |
|---|---|---|---|
| 01 | බස්නැවතුම්පල කඩකාමර අංක ඩී-29 | මොහොමඩ් අලිසිකන්දර් | කාදීර් මීරා සයිබු අමානුල්ලා |
| 02 | පදික කඩ අංක 185/7 | බමුණුසිංහ ආරච්චිලාගේ කමලා මැණිකේ | ඇල්ලෙ වත්තෙ ආරච්චිලාගේ සුජිත නිපුන් ඇල්ලෙවත්ත |
| 03 | නව පදික කඩ කාමර අංක | උඩගංගොඩ කුඩකාරරාලලාගේ | මාරසිංහ |

| | | | |
|---|---|---|---|
| | 197/13 | සිරිපාල | මුදියන්සේලාගේ ප්‍රසන්න ගයාන් ආනන්ද |

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් යෝජනා කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී ඩබ්.එම්.එම්.බී බණ්ඩාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**ඒ අනුව විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**07:01:04** 2025 වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණ වාර්තාවේ නිර්දේශ ඇතුලත් පිටපත ගරු මහ සභාවේ අනුමැතිය ලබා ගැනීම සඳහා ඉදිරිපත් කිරීම.

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් යෝජනා කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී ඩබ්.එම්.එම්.බී බණ්ඩාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

මෙහිදී ගරු නාගරික මන්ත්‍රී එච්.ඒ.එච්.එන් හෙට්ටිආරච්චි මැතිතුමා සභාවේ චේන්සෝ යන්ත්‍රය පිළිබඳව පසුගිය සභාවකදී විමසන ලද බවත්, එහිදී චේන්සෝ යන්ත්‍රයේ කොටස් ටික හෝ සභාවට රැගෙන එන ලෙස දැනුම් දුන් බවත්, මෙම භාණ්ඩ සමීක්ෂණ වාර්තාවේ ඒ පිළිබඳ සඳහනක් ඇතුළත්ද යන්නත් විමසන ලදී.

අනතුරුව ගරු සභාපතිතුමා විසින් ඒ පිළිබඳ සාකච්ඡා කිරීම සඳහා මහ සභාව කාරක සභාවක් බවට පත් කිරීමට යෝජනා කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී එම්.ඩබ්.විමලසිරි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

අදාළ කරුණු පැහැදිලි කර ගැනීමෙන් අනතුරුව ගරු සභාපතිතුමාගේ යෝජනාවෙන් සහ ගරු නාගරික මන්ත්‍රී ඩබ්.ඩී වසන්ත කුමාර මැතිතුමාගේ ස්ථිරත්වයෙන් කාරක සභාව මහ සභාව බවට පත් කරන ලදී.

**ඒ අනුව විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**07:01:05**. 2025 වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණයේ ඉවත් කරන ලද භාණ්ඩ වෙන්දේසි කිරීමේ කටයුතු 2026 මාර්තු මස 18 වන දින සිදු කිරීමට නියමිත ය. එදින වෙන්දේසි කමිටුවේ නිලධාරි මණ්ඩලය පහත පරිදි වන අතර ඒ සඳහා ගරු මන්ත්‍රී මණ්ඩලයේ සාමාජිකයන් දෙදෙනෙක් ද පත් කිරීමට යෝජනා කරමි.

- එම්.එස්.ජී.ගුණවර්ධන මිය - ගණකාධිකාරි
- එස්.එම්. සී. එස්. කේ.අබේසිරිවර්ධන මහතා - වැඩ අධිකාරි
- එම්.එන්.පී.මුණසිංහ මහතා - කාර්මික නිලධාරි

- රජිත කොස්වත්ත මයා - සංවර්ධන නිලධාරි
- අමල් ප්‍රියංකර මහතා - සංවර්ධන නිලධාරි
- එච්.ඩී.ඩී.දීපානි මෙය - සංවර්ධන නිලධාරි
- ජී.ජී.ඒ.එම්.විජේරත්න මයා - කළමණාකරන සේවා නිලධාරි

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් යෝජනා කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී ඩබ්.එම්.එම්.බී බණ්ඩාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

ගරු සභාපතිතුමා පැවසූයේ ඉහත වෙන්දේසි කමිටුව සඳහා ගරු මන්ත්‍රී මණ්ඩලයේ සාමාජිකයන් දෙදෙනෙක් පත් කරන ලෙසයි.ඒ අනුව එකී කමිටුව සඳහා ගරු නාගරික මන්ත්‍රී එච්.ඒ.එච්.එන් හෙට්ටිආරච්චි මැතිතුමා සහ ගරු නාගරික මන්ත්‍රී ජී.ජී.ජී.එන් සේනාරත්න මැතිතුමා පත් කිරීම සුදුසු බවට යෝජනා කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී එම්.ටී.එම් රුමි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**ඒ අනුව විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනා ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**07:01:06** 2026.02.27 දින මුදල් කමිටු තීරණ මහ සභාව වෙත ඉදිරිපත් කිරීම

**07:01:06:01**පොලෙහි තොග වෙළඳ මධ්‍යස්ථානයෙහි පොල පවත්වන දින හා පොල නොපවත්වන දිනවල වෙළෙන්දන් සඳහා වෙළදාම් කිරීමට ඉඩ වෙන් කිරීම අක්‍රමවත් බවක් ඇති බැවින් ඒ සඳහා විධිමත් ක්‍රමයක් සකස් කිරීමට අනුමැතිය ලබා ගැනීම.

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් යෝජනා කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී ඩබ්.එම්.එම්.බී බණ්ඩාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

ගරු නාගරික මන්ත්‍රී එච්.ඒ.එච්.එන් හෙට්ටිආරච්චි මැතිතුමා සඳහන් කලේ පොළෙහි තොග වෙළඳ මධ්‍යස්ථානයේ එක් එක් වෙළඳුන්ය වෙන් කර ඇති ඉඩ ප්‍රමාණය නිසි ක්‍රමවේදයක් මත ලබා දිය යුතු බවයි. ගරු සභාපතිතුමා පැවසූයේ එම මධ්‍යස්ථානයේ වහලයේ පරවියන්ගෙන් සිදුවන කරදරය අවම කිරීමට දැලක් ගැසීමට ඉදිරියේදී කටයුතු කරන බවත්, එම මධ්‍යස්ථානයේ වෙළඳුන් වෙත ඉඩකඩ විධිමත් ලෙස ලබාදීමටත් ක්‍රියා කරන බවයි.

**ඒ අනුව විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**07:01:07** 255 වන අධිකාරය නගර සභා ආඥා පනතේ 224 වගන්තිය යටතේ වන අධිකාරය පිරිනැමීම.

255 වන අධිකාරය නගර සභා ආඥා පනතේ 36 වගන්තිය සමඟ කියවිය යුතු එකී ආඥා පනතේ 159 වගන්තිය යටතේ හෝ වෙනත් යම් ලිඛිත නීතියක් යටතේ බළන්ගොඩ නගර සභාවේ අරමුදලින් කළ හැකි වියදමකට අදාළව, අදාළ වියදම රුපියල් පනස් දහස(රු 50,000.00) නොඉක්මවන ප්‍රාග්ධන වියදම් සම්බන්ධව වන විටදී හා අදාළ වියදම රුපියල් පනස් දහස (රු 50,000.00) නොඉක්මවන පුනරාවර්තන වියදම් සම්බන්ධව වන විටදී වියදමට අදාළව බලය දීම සඳහා බළන්ගොඩ නගර සභාවේ සභාපතිවරයාගේ පොදු පරිපාලනයට යටත්ව 255 වන අධිකාරය නගර සභා ආඥා පනතේ 224 වගන්තිය යටතේ බළන්ගොඩ නගර සභාවේ ලේකම් වෙත අධිකාරය පැවරිය යුතු බවටත් තවද එකී අධිකාරය මෙම යෝජනාවට අදාළ සභාවේ සභා සම්මුතිය බළන්ගොඩ නගර සභාව විසින් පරිච්ඡින්න කරන තාක් වලංගුව බලපැවැත්විය යුතු බවටත් යෝජනා කරමි.

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් යෝජනා කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී ඩබ්.එම්.එම්.බී බණ්ඩාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.ඉහත යෝජනාව පිළිබඳව අදහස් දැක්වූ ගරු සභාපතිතුමා පැවසුයේ ඉහත වියදම් සීමාව අවශ්‍ය පරිදි වැඩිකර සංශෝධනය කළ හැකි බවයි.

ගරු නාගරික මන්ත්‍රී ඩබ්.එම්.එම්.බී බණ්ඩාර මැතිතුමා, ඉහත වියදම් සීමාව රු.100,000.00 ක් දක්වා වැඩි කිරීමට යෝජනා කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

ඒ අනුව 255 වන අධිකාරය නගර සභා ආඥා පනතේ 36 වගන්තිය සමඟ කියවිය යුතු එකී ආඥා පනතේ 159 වගන්තිය යටතේ හෝ වෙනත් යම් ලිඛිත නීතියක් යටතේ බළන්ගොඩ නගර සභාවේ අරමුදලින් කළ හැකි වියදමකට අදාළව, අදාළ වියදම රුපියල් ලක්ෂය(රු 100,000.00) නොඉක්මවන ප්‍රාග්ධන වියදම් සම්බන්ධව වන විටදී හා අදාළ වියදම රුපියල් ලක්ෂය (රු 100,000.00) නොඉක්මවන පුනරාවර්තන වියදම් සම්බන්ධව වන විටදී වියදමට අදාළව බලය දීම සඳහා බළන්ගොඩ නගර සභාවේ සභාපතිවරයාගේ පොදු පරිපාලනයට යටත්ව 255 වන අධිකාරය නගර සභා ආඥා පනතේ 224 වගන්තිය යටතේ බළන්ගොඩ නගර සභාවේ ලේකම් වෙත අධිකාරය පැවරිය යුතු බවටත් තවද එකී අධිකාරය මෙම යෝජනාවට අදාළ සභාවේ සභා සම්මුතිය බළන්ගොඩ නගර සභාව විසින් පරිච්ඡින්න කරන තාක් වලංගුව බලපැවැත්විය යුතු බවටත් වන සංශෝධිත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.

**07:01:08** බළන්ගොඩ නගර සභාවේ සභාපතිතුමාගේ පෞද්ගලික ලේකම් ලෙස වතුපල්ලේ විදානෙලාගේ ධර්මරත්න යන අය බඳවා ගැනීමටත්, සබරගමුව පළාත් පාලන කොමසාරිස්

චක්‍රලේඛය CLG/LG/02/16/2019 ප්‍රකාරව මාසිකව රු. 15,000 ක දීමනාවක් සභා අරමුදලින් ගෙවීම් කිරීමටත් අනුමැතිය ලබාගැනීම.

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් යෝජනා කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී ඩබ්.ඩී වසන්ත කුමාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

ගරු නාගරික මන්ත්‍රී එච්.ඒ.එච්.එන් හෙට්ටිආරච්චි මැතිතුමා සභාපතිතුමාගේ වැඩ කටයුතු වෙනුවෙන් පෞද්ගලික ලේකම් වරයෙක් අත්‍යවශ්‍ය බවත්, එම තනතුරේ කාර්යයභාර්ය පුළුල් පරාසයක් පවතින බැවින් සංවර්ධන නිලධාරියෙකු මේ සඳහා යොදා ගන්නේ නම් සුදුසු බවත්, සභාවේ දැනට සංවර්ධන නිලධාරින් අතිරික්ත ප්‍රමාණයකුත් සිටින බවත්ය.ගරු සභාපතිතුමා පැවසුයේ ඒ පිළිබඳ සලකා බලන බවයි.

**ඒ අනුව විරෝධතා නොවූ හෙයින් ඉහත මුල් යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**07:01:09** පේරාදෙණිය විශ්ව විද්‍යාලයේ සමාජ විද්‍යා පාඨමාලාව හදාරන පහත නම් සඳහන් ශිෂ්‍යයාව විසින් අප ආයතනයේ මාස 04ක පුහුණුවක් ඉල්ලා සිටින අතර අදාල පුහුණුවීම 2026.03.11 දින සිට ලබා ගැනීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම.

01. ඩබ්. පී. දිලානි නිර්මදා සේනාරත්න ( ජා.හැ.අංක 200182702615)
(ලිපිනය 598/2,ඇල්ලවත්ත,රාස්සගල,බළන්ගොඩ)

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් යෝජනා කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී ඩබ්.ඩී වසන්ත කුමාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**ඒ අනුව විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**07:01:10** බළන්ගොඩ නගර සභාව සතු තානායම වසර 03ක කාලයකට ටෙන්ඩර් කිරීමට අනුමැතිය ලබා ගැනීම.

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් යෝජනා කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී ඩබ්.එම්.එම්.බී බණ්ඩාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

ගරු සභාපතිතුමා ඉහත යෝජනාව පිළිබඳ අදහස් දක්වමින් පැවසුයේ නාගරික සංවර්ධන අධිකාරිය මන්ත්‍රී මණ්ඩලය සමඟ මේ පිළිබඳ සාකච්ඡාවක් පැවැත්වීමට කටයුතු සූදානම් කර තිබුනද එය පැවැත්වීමට නොහැකි වූ බවත්, ඒ අනුව පළාත් අධ්‍යක්ෂතුමිය සමඟ කොළඹදී සාකච්ඡාවක් පැවැත්වූ බවත්, එහිදී සාකච්ඡා වූ පරිදි තානායම නාගරික සංවර්ධන අධිකාරිය

වෙත පවරා ගැනීමේ කටයුතු මේ වන විට ආරම්භ කර ඇති බවත්, නමුත් ඒ සඳහා විශාල කාලයක් ගත වන බැවින් සභාවට ඒ වන තෙක් තානායම ටෙන්ඩර් ලබාදිය හැකි බවත්,එම කටයුතු ආරම්භ කරන ලෙසටත් උපදෙස් ලබා දුන් බවත්, ඒ සඳහා අවශ්‍ය අනුමැතිය ලබා දීමට එකඟ වූ බවත්ය.

ගරු නාගරික මන්ත්‍රී ඩබ්.එම්.එම්.බී බණ්ඩාර මැතිතුමා පැවසුයේ සභාවට නොමැති වුවද බළන්ගොඩ ජීවත්වන ජනතාව ලෙස සභාව සතු තානායම නාගරික සංවර්ධන අධිකාරිය පවරාගෙන කුමන තත්වයෙන් පවත්වා ගෙන යන්නේද පිළිබඳව විමසා බැලිය යුතු බවත්, තිබෙන තත්වයට වඩා උසස් තත්වයකින් පවත්වා ගෙන යෑම අපේක්ෂා කරන බවත්, සභාවට තිබෙන ආදායම් මාර්ගයක් අහිමි වීමක් බැවින් ඒ පිළිබඳව සලකා බලා තීරණයක් ගැනීම සුදුසු බවත්ය.

ගරු සභාපතිතුමා පැවසුයේ ඉහත 07:01:10 යෝජනාව මඟින් දක්වා ඇති බළන්ගොඩ නගර සභාව සතු තානායම වසර 03ක කාලයකට ටෙන්ඩර් කිරීමේ යෝජනාව සම්බන්ධයෙන් කිසිඳු ගැටළුවක් නොමැති බැවින් එම යෝජනාව ක්‍රියාත්මක කළ යුතු බවත්, ඉන් පසුව සභාව තානායම අළුත්වැඩියාව සඳහා වැයකර ඇති මුදල් ප්‍රමාණය සහ බැංකු ණය මුදල පිළිබඳව අත්පත්කරගැනීමේ ක්‍රියාවලියේදී පැහැදිලි කර ඇති බවත්, එම ණය මුදල් සම්බන්ධව පළාත් පාලන ආයතනයට බරක් නොවන ලෙස ක්‍රියාකරන බව දක්වා ඇති බවත්ය.

මේ පිළිබඳව වැඩිදුරටත් අදහස් දැක්වූ ගරු සභාපතිතුමා පැවසුයේ නාගරික සංවර්ධන අධිකාරිය මෙය පවරාගෙන ඉදිරියේදී සිදුකරන දෙය පිළිබඳව විමසීම් කළ බවත්, යම් යම් නවීකරණයන් සිදුකර නැවත ටෙන්ඩර් කිරීම සිදු කරනු ඇති බවත්ය.මෙහිදී ගරු නාගරික මන්ත්‍රී එච්.ඒ.එච්.එන් හෙට්ටිආරච්චි මැතිතුමා විමසීම් කලේ තානායම නාගරික සංවර්ධන අධිකාරිය පවරාගෙන සිදු කරන්නේද ටෙන්ඩර් කිරීමම නම් සභාව සතුව තිබියදීම ටෙන්ඩර් කිරීමට ඇති හැකියාව පිළිබඳව නාගරික සංවර්ධන අධිකාරිය සමඟ සාකච්ඡා කලේද යන්නයි.ගරු සභාපතිතුමා පැවසුයේ බළන්ගොඩ නගර සභාව සතු තානායම පමණක් නොව සමස්ථයක් ලෙස පළාත් පාලන ආයතන මඟින් තානායම් පාලනය කිරීම විධිමත් ආකාරයට සිදු නොවීම සහ ලබන ආදායමට වඩා ඉතා ඉහළ ආදායම් ලැබිය හැකි මූලාශ්‍ර බවට රජය හඳුනාගැනීම මත මෙලෙස පවරාගැනීමට හේතු වී ඇති බවත්ය.

ගරු නාගරික මන්ත්‍රී ඩබ්.ඒ වසන්ත පුෂ්පකුමාර මැතිතුමා සඳහන් කලේ තානායම ටෙන්ඩර් කිරීම සම්බන්ධව කිසිඳු ගැටළුවක් නොවන බවත්, කමිටුවක් පත්කර හෝ නිසි පරිදි කොන්දේසි ඇතුළත් කර විධිමත් ගිවිසුමක් සකස් කළ යුතු බවත්ය.

මීන් පෙර සභා වාරයකදී තානායමේ කටයුතු වෙනුවෙන් කමිටුවක් පත්කල බැවින් එම කමිටුවම බලාත්මක කර විධිමත් පරිදි ගිවිසුමක් සකස් කිරීම ආදි ඉදිරි කටයුතු වෙනුවෙන් ක්‍රියාකළ යුතු බව ගරු නාගරික මන්ත්‍රී නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා පවසන ලදී.

**ඒ අනුව විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**07:01:11** බළන්ගොඩ නගර සභාව සතු තානායමේ ගෘහභාණ්ඩ අළුත්වැඩියා කිරීම සහ මිදුල සකස් කිරීම සම්බන්ධව තීරණය කිරීම.

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් යෝජනා කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී ඩබ්.ඩී වසන්ත කුමාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

ගරු සභාපතිතුමා මෙහිදී අදහස් දක්වමින් පැවසුයේ තානායම පවරාගැනීමට අදාළ කැබිනට් තීරණයට පෙර තානායමේ ගෘහභාණ්ඩ අළුත්වැඩියා කිරීම සහ මිදුල සකස් කිරීමට සූදානමක සිටි බවත්, නමුත් එම කැබිනට් තීරණයත් සමඟ එකී අළුත්වැඩියා නතර කළ බවත්, ඒ අනුව ඉහත යෝජනාවෙන් දක්වා ඇත්තේ නැවත එසේ අළුත්වැඩියාවකට යනවාද එසේ නොමැතිනම් තිබෙන තත්වයෙන්ම ටෙන්ඩර් කරනවාද යන්න පිළිබඳව තීරණය කිරීම බවත්, තමාගේ පෞද්ගලික අදහස වන්නේ තිබෙන තත්වයෙන් ටෙන්ඩර් කිරීම බවත්, එසේ නොමැති නම් ඊට තවත් කාලයක් ගත වනු ඇති බවත්ය.

අවශ්‍ය මූලික පහසුකම් පමණක් සපයා තිබෙන තත්වයෙන් ටෙන්ඩර් කිරීම සුදුසු බව ගරු නාගරික මන්ත්‍රී එම්.ටී.එම් රුමි මැතිතුමා පවසන ලදී.

ගරු නාගරික මන්ත්‍රී එච්.ඒ.එච්.එන් හෙට්ටිආරච්චි මැතිතුමා සඳහන් කලේ ගරු සභාපතිතුමාගේ තීරණයට එකඟ වන බවත්, තවත් කාලයක් මෙය තබාගෙන සිටිනවාට වඩා කඩිනමින් අවශ්‍ය කටයුතු සිදුකර ටෙන්ඩර් ලබා දීම සුදුසු බවත්ය.

**ඒ අනුව තානායම මූලික පහසුකම් පමණක් සපයා තිබෙන තත්වයෙන් ටෙන්ඩර් කිරීමට ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**07:01:12** බළන්ගොඩ නගර සභාව සතු තානායම සඳහා නව තක්සේරුවක් ලබා ගැනීම සම්බන්ධව තීරණය කිරීම.

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් යෝජනා කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී ඩබ්.ඩී වසන්ත කුමාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

ගරු සභාපතිතුමා කරුණු දක්වමින් පැවසූයේ නවීකරණයන් සිදු නොකර තිබෙන තත්වයෙන්ම තක්සේරුවක් ලබා ගැනීමේදී තක්සේරු මුදලෙහි යම් අඩුවීමක් සිදුවන බවත්, නමුත් දැනට එසේ කිරීමට සිදු වන බවත්ය.

**ඒ අනුව විරෝධතා නොවූ හෙයින් ශානායම තිබෙන තත්වයෙන්ම නව තක්සේරුවක් ලබා ගැනීමට ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**07:01:13** ඝණ අපද්‍රව්‍ය කළමණාකරණය සඳහා ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත BSF අපද්‍රව්‍ය ජෛව පරිවර්තන ව්‍යාපෘතිය ඇක්වාටෙරා ඉන්ටර්නැෂනල් පුද්ගලික සමාගම සමඟ සිදු කිරීම පිළිබඳව සභාවේ අනුමැතිය ලබා ගැනීම.

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් යෝජනා කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

ඉහත ඉදිරිපත් කළ යෝජනාව පිළිබඳව අදහස් දැක්වූ ගරු සභාපතිතුමන් පැවසූයේ පසුගිය මාර්තු 06 වන දින මේ සම්බන්ධව මූලික සාකච්ඡාවක් බළන්ගොඩ ප්‍රාදේශීය සභාවේ ගරු සභාපතිතුමා, මහජන සෞඛ්‍ය පරීක්ෂක තුමන් ඇතුළු පිරිස සම්බන්ධ වූ බවත්, එහිදි දැනට මෙය රත්නපුර මහ නගර සභාවේ ක්‍රියාත්මක වන බවත්, ඇක්වාටෙරා ඉන්ටර්නැෂනල් පුද්ගලික සමාගම මඟින් මෙම ව්‍යාපෘති යෝජනාව යොමු කර ඇති බවත්ය.

ගරු සභාපතිතුමා වැඩිදුරටත් අදහස් දක්වමින් පවසා සිටියේ ඝණ අපද්‍රව්‍ය කළමණාකරණ මධ්‍යස්ථානයේ කසළ ටොන් 01ක් කොම්පෝස්ට් බවට පත්වීමට මාස 03ක පමණ කාලයක් ගත වන බවත්, නමුත් මෙම ව්‍යාපෘතිය හරහා කළු සොල්දාදු මැස්සා යන කෘමි විශේෂය මඟින් ලබා ගනු ලබන පණුවෙකු හරහා දින 14ක් වැනි කෙටි කාලයක් තුළ පොහොර බවට පත්වන බවත්, මෙහිදී එම සමාගමට අවශ්‍යවන්නේ එයින් කීට අස්වැන්නක් ලබා ගැනීම බවත්, සභාවට අවශ්‍යවන්නේ කොම්පෝස්ට් නිෂ්පාදනය බවත්, ඒ අනුව බළන්ගොඩ නගර සභාවේ එම ව්‍යාපෘතිය සඳහා අවස්ථාව ලබා දෙන ලෙස ඉල්ලීම් කර ඇති බවත් අවශ්‍ය පැහැදිලි කිරීම් සිදු කර ගෙන එම යෝජනාව සඳහා අනුමැතිය ලබා දෙන ලෙසත්ය.

ඒ අනුව වැඩිදුර කරුණු මහජන සෞඛ්‍ය පරීක්ෂක මහතාගෙන් දැනගැනීම සඳහා ගරු සභාපතිතුමා මහ සභාව කාරක සභාවක් බවට යෝජනා කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී එම්.ටී.එම් රූමි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

පසුගියදා පැවති ඉහත ආයතනයේ දැනුවත්කිරීම පිළිබඳ මහජන සෞඛ්‍ය පරීක්ෂක මහතා කරුණු පැහැදිලි කර ගැනීමෙන් අනතුරුව, ගරු සභාපතිතුමා කාරක සභාව මහ සභාව බවට යෝජනා කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී ඩබ්.ඩී වසන්ත කුමාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

ඒ අනුව ඉහත ව්‍යාපෘතිය නියමු ව්‍යාපෘතියක් ලෙස බළන්ගොඩ නගර සභාවේ බැංකියවත්ත ඝණ කළමණාකරණ මධ්‍යස්ථානය තුළ ක්‍රියාත්මක කිරීමට සඳහා විරෝධතා නොමැති හෙයින් ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.

ගරු නාගරික මන්ත්‍රී එච්.ඒ.එච්.එන් හෙට්ටිආරච්චි මැතිතුමා සඳහන් කලේ බැංකියවත්ත ඝණ අපද්‍රව්‍ය කළමණාකරණ මධ්‍යස්ථානයේ නිරීක්ෂණයක යෙදුන බවත්, එහිදී පොලිතීන් කපන මැෂිම දැනට මැනුවල් ක්‍රමයට වැඩ කරන බවත්, එම යන්ත්‍රයට සවිකර තිබූ මෝටරය නොමැති බවත්, ඒ හේතුවෙන් දැනට යොමුකළ යුතු සේවක ප්‍රමාණයද වැඩිවී ඇති බවත්, නමුත් එම යන්ත්‍රය නිසියාකාරව ක්‍රියාත්මක වන්නේ නම් මීට වඩා කාර්යක්ෂමව පොලිතීන් කැපීම සිදු කළ හැකි බවත්, එම මධ්‍යස්ථානයේ සේවකයන් 20දෙනෙකු පමණ සිටින බවත්, එම පිරිස කසළ වෙන් කිරීමේ කාර්යයට මහත් වෙහෙසක් දරන බවත්, නගරයේ වෙළඳසැල් හිමියන් ඇතුළු සියළු දෙනා ඒ පිළිබඳ දැනුවත් කළ යුතු බවත්, ඉහත යන්ත්‍රය කඩිනමින් අළුත්වැඩියා කර ලබා දී එම ස්ථානයේ කටයුතු කාර්යක්ෂම කිරීමට අවධානය යොමු කරන ලෙසත්ය.

ගරු සභාපතිතුමා පැවසුයේ නගරයේ ව්‍යාපාරිකයන් පාසල් දරුවන් ඇතුළු සියළු දෙනාට ඝණ අපද්‍රව්‍ය කළමණාකරණ මධ්‍යස්ථානයේ සේවකයන් කසළ වෙන් කිරීමට දරන වෙහෙස පෙන්විය යුතු බවයි.

**07:01:14** බළන්ගොඩ නගරයේ 99 බස් නැවතුම්පොළ අලුත්වැඩියා කිරීම සඳහා අවසර ලබා දෙන ලෙස එස්.ඒ නිශාන් අරවින්ද, සුශිල්පා අධ්‍යාපන ආයතනය, පෙට්ටිගල පාර,බළන්ගොඩ යන අය යොමු කර ඇති ඉල්ලීම පිළිබඳ තීරණය කිරීම.

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් යෝජනා කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

මෙහිදී ගරු නාගරික මන්ත්‍රී එච්.ඒ.එච්.එන් හෙට්ටිආරච්චි මැතිතුමා සඳහන් කලේ දැනට එම ස්ථානයේ සබරගමුව පළාත් සභාවෙන් බළන්ගොඩ පුරවරයේ සංචරණය කළ හැකි ස්ථාන පිළිබඳව ප්‍රදර්ශන පුවරු සවිකර ඇති බවත්, මෙම ඉල්ලීමට අනුව ප්‍රතිසංස්කරණය කිරීමේදී එම ආයතනයේ දැන්වීම් ප්‍රචාරණය කිරීමක් සිදුවන බවත්ය.

ගරු සභාපතිතුමා පැවසුයේ මාර්ගස්ථ මඟී ප්‍රවාහන අධිකාරියෙන්ද පොදුවේ දිස්ත්‍රික්කය තුළ බස්නැවතුම්පොළවල් නවීකරණයන් සිදු කරන බවට දැනුම්දීමක් සිදු කර ඇති බවත්, ඒ අනුව එම අධිකාරිය වෙත ඉල්ලීමක් යොමු කරන ලෙස දැනුම්දුන් බවත්ය.

ගරු නාගරික මන්ත්‍රී ඩබ්.එම්.එම්.බී බණ්ඩාර මැතිතුමා සඳහන් කලේ ඉහත ඉල්ලීම යොමු කර ඇති මහත්මා සාකච්ඡා කළ බවත්, තිබෙන බස් නැවතුම්පොළ නොව නව බස්නැවතුම්පළක් SMART ආකාරයට ඉදිකිරීමට බලාපොරොත්තු වන බව පැවසූ බවත්ය.

මෙහිදී ගරු සභාපතිතුමා පැවසුයේ, බළන්ගොඩ හරහා කොළඹ බදුල්ල බස්රථ ගමනාගමනයේදී නගරය මගහැර යාම වෙනුවට බස්නැවතුම්පොලේ වෙනම ස්ථානයක් වෙන්කර එම පහසුකම් සැලසීම වෙනුවෙන් දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවේදී සාකච්ඡා කළ බවත්,ඉහත ඉල්ලීම යොමුකර ඇති ආයතනයේ ව්‍යාපෘති යෝජනාව පිළිබඳව විමසීම් කළ යුතු බවත්ය.

මෙහිදී ගරු නාගරික මන්ත්‍රී එස්.යූ.සී ජයනක මැතිතුමා සඳහන් කලේ නගරයේ ව්‍යාපාරිකයන්ට එය අසාධාරණයක් වන බවත්, එවැනි තීරණ ගැනීමේදී නගරයේ මන්ත්‍රීවරුන් ගෙන්වා තීරණ ගත යුතු බවත්, නාගරික සංවර්ධන අධිකාරියේ රැස්වීම් සඳහා නාගරික මන්ත්‍රීවරුන්ට අවස්ථාව ලබා දෙන ලෙසත්ය.

ගරු සභාපතිතුමා පැවසුයේ නාගරික සංවර්ධන අධිකාරියේ නිලධාරීන් සමඟ පැවති නව නගර සැලැස්ම සාකච්ඡා කිරීමේ වැඩසටහන පිළිබඳව සියළුම නාගරික මන්ත්‍රීතුමන්ලා වෙත දැනුම් දුන් බවයි.

ඉහත ආයතනය යොමුකර ඇති ඉල්ලීම සඳහා මූලික අවසරය මාර්ග සංවර්ධන අධිකාරියෙන් ගත යුතු බවද, මන්ත්‍රීවරුන්ට දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුව නියෝජනය කිරීමට අවස්ථාවක් නොමැති බවද, සුශිල්පා ආයතනයේ යොමුකර ඇති ඉල්ලීමේ එම ඉදිකිරීමට අදාළ සියළු විස්තර ඇතුළත් කර නොමැති බවද, ඒ හේතුවෙන් සභාවේ තීරණයක් ගැනීමට නොහැකි බවද ගරු නාගරික මන්ත්‍රී ඩබ්.ඒ වසන්ත ගුණරත්න මැතිතුමා පවසන ලදී.

ගරු නාගරික මන්ත්‍රී නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා පවසන ලද්දේ ගරු සභාපතිතුමා නාගරික සංවර්ධන අධිකාරිය සමඟ ගන්නා තීන්දු තීරණ වලදී නාගරික මන්ත්‍රීතුමන්ලා සම්බන්ධ කරගන්නා ලෙසත්, එම අධිකාරියට අවශ්‍ය පරිදි තීන්දු තීරණ ලබා ගත්තද බළන්ගොඩ නගරයේ ජනතාව වෙනුවෙන් නාගරික මන්ත්‍රීතුමන්ලා වගකීමට බැඳෙන බවත්ය.

නාගරික සංවර්ධන අධිකාරියේ සමහර සැලසුම් යථාර්ථයක් බවට පත් කිරීම ඉතා අසීරු බවත්, මහපොළොවේ තිබෙන ගැටළු හඳුනාගෙන ක්‍රියාකළහැක්කේ මහජන නියෝජිතයන්ට බවත්, ඒ අනුව එම කටයුතු වලට ජනතා නියෝජිතයන් සම්බන්ධ විය යුතු බවත්ය.

ගරු සභාපතිතුමා මෙහිදී පැවසුයේ පසුගිය දිනෙක නාගරික සංවර්ධන අධිකාරියේ අධ්‍යක්ෂතුමිය සමඟ සාකච්ඡා කළ බවත්, එතුමියද පැවසුයේ පසුගිය කාලවලදී සිදු වන්නේ නාගරික සංවර්ධන අධිකාරියෙන් ගෙන එන යෝජනාවත් දේශපාලන අධිකාරියට ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය යෝජනාවත් දෙකක් බැවින් එම දෙකෙන් එකක්වත් සිදු නොවන බවත්, නමුත් දැන් එම අධිකාරිය විසින් ගෙන එන ලබන සැලසුම් කෙරෙහි වර්තමාන දේශලපාලන අධිකාරිය සාධනීය ලෙස සලකා බලා මහපොළොවේ ක්‍රියාත්මක කළ හැකි

යෝජනා නිරීක්ෂණය කර දෙපාර්ශවයටම අවශ්‍ය පරිදි සාකච්ඡා කර ක්‍රියාත්මක වන බව බවත්ය.

විශේෂයෙන්ම බළන්ගොඩ නගර සභාව මඟින් ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත හෙළ බොජුන්හල ව්‍යාපෘතිය සිදු කිරීමට අවශ්‍ය භූමිය සම්බන්ධ කටයුතු නාගරික සංවර්ධන අධිකාරියේ මේ දිනවල සිදු වන බවත්, ඒ අනුව මෙම වර්ෂය අවසන් වීමට මත්තෙන් එම ව්‍යාපෘතියද ආරම්භ කිරීමට හැකිවනු ඇති බවත් ගරු සභාපතිතුමා වැඩිදුරටත් කරුණු දක්වමින් පවසන ලදී.

ගරු නාගරික මන්ත්‍රිනී පී.කේ.එන්.ටී.ඩී සමරසේකර මැතිතුමිය සඳහන් කලේ දුර ගමන් සේවා බස් රථ සවස 6න් පසුව හෝ මොහාන්සාලිය මාවතෙන් යැවීමට කටයුතු කරන්නේ නම් එය මඟීන්ට පහසුවක් වනු ඇති බවත්, එමඟින් වෙළඳ ප්‍රජාවට පාඩුවක් සිදු නොවන බවත්ය.

ඒ අනුව ඉහත යෝජනාවට අදාළ ඉල්ලීම යොමුකර ඇති සුශිල්පා අධ්‍යාපන ආයතනය සමඟ සැලැස්ම පිළිබඳ සාකච්ඡා කර ඉදිරි කටයුතු තීරණය කිරීම සුදුසු බවට ගරු සභාවේ තීරණය විය.

.

**07:02** ගරු නාගරික මන්ත්‍රී කේ.ජී.පේමදාස මැතිතුමා

**07:02:01** බළන්ගොඩ නගරයට අත්‍යවශ්‍යව පවතින රජයේ ඔසුසලක් ආරම්භ කිරීමට අවශ්‍ය කටයුතු සම්පාදනය කරන ලෙස යෝජනා කරමි.

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් යෝජනා කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී ඩබ්.එම්.එම්.බී බණ්ඩාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

ගරු නාගරික මන්ත්‍රී කේ.ජී පේමදාස මැතිතුමා ඉහත යෝජනාව පිළිබඳ අදහස් දක්වමින් පැවසුයේ බළන්ගොඩ නගරයේ පෞද්ගලික ඔසුසල්වල ඖෂධ මිල ගණන් ඇතැම් අවස්ථාවල අධික බවත්, රජයේ ඔසුසලක් ආරම්භ කිරීමෙන් අඩු මිලක් යටතේ ජනතාවට ඖෂධ ලබා ගත හැකි බවත්, ඒ සඳහා අවශ්‍ය පියවර ලබා ගන්නා ලෙසත් අත්‍යවශ්‍යයෙන්ම ක්‍රියාත්මක කළ යුතු යෝජනාවක් බවත්ය.

ගරු සභාපතුමා පැවසුයේ කහවත්ත, ඇඹිලිපිටිය, බළන්ගොඩ යන නගරවල රාජ්‍ය ඔසුසල් ආරම්භ කිරීම සම්බන්ධව රත්නපුර දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවට යෝජනා ලැබුණ බවත්, ඒ අනුව ගරු රත්නපුර දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී වසන්ත පුෂ්පකුමාර මැතිතුමාද ඒ සඳහා මැදිහත්වී බළන්ගොඩ නගරයේ රාජ්‍ය ඔසුසලක් ස්ථාපිත කිරීමේ යෝජනාව ස්ථිර වී ඇති බවත්, මේ වන විට පවතින ගැටළුව වන්නේ නිශ්චිත ස්ථානයක් නොමැතිකම බවත්, ඒ සඳහා

සුදුසු ස්ථානයක් සූදානම් කිරීමට අවශ්‍ය පියවර ගන්නා බවත්, කෙසේ වුවද මෙම වර්ෂයේදී එය ආරම්භ කිරීමට හැකි වනු ඇති බවත්ය.

ගරු නාගරික මන්ත්‍රී එච්.ඒ.එච්.එන් හෙට්ටිආරච්චි මැතිතුමා පැවසුයේ ඉහත ඉදිරිපත් කර ඇති යෝජනාව ඉතා සාධනීය යෝජනාවක් බවත්, සභාව ස්ථානයක් මේ සඳහා ලබා දිය හැකිනම් එම ආදායමද සභාවට ලබා ගත හැකි බවත්ය.ගරු සභාපතිතුමා පැවසුයේ ඒ පිළිබඳව සොයා බලන බවයි.

**ඒ අනුව විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**07:02:02** බළන්ගොඩ නගරයේ තාවකාලිකව මෘත දේහ තැන්පත් කිරීම සඳහා ශාලාවක් සහිත පහසුකම්වලින් යුතු ගොඩනැගිල්ලක් (Funeral Parlor)ඉදිකිරීමට යෝජනා කරමි.

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් යෝජනා කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී එච්.ඒ.එච්.එන් හෙට්ටිආරච්චි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

ගරු නාගරික මන්ත්‍රී කේ.ජී පේමදාස මැතිතුමා සඳහන් කලේ ඉහත යෝජනාව කාලීන අවශ්‍යතාවයක් බවත්, අද වන විට මෘහ දේහයක් සම්බන්ධව නිවසක කටයුතු කිරීම ඉතා වියදම් අධික කාර්යයක් බවත්, ලංකාවේ බොහෝ නගරවල මේවා පවතින බවත්, ඒ සඳහා සුදුසු ඉඩම් කොටසක් නාගරික සංවර්ධන අධිකාරිය මඟින් සභාව වෙත පවරාගෙන හෝ සභාව සතු ඉඩමක හෝ ගොඩනැගිල්ලක් ඉදිකර කර මෙම යෝජනාව ක්‍රියාත්මක කළ යුතු බවත්ය.

**ඒ අනුව විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**07:03 ගරු නාගරික මන්ත්‍රී නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා**

**07:03:01** ළමා උද්‍යානය අසල ඉදිකර ඇති භූමි කොටසේ එළිමහන් ව්‍යායාම උපකරණ කට්ටල සවි කිරීමට යෝජනා කරමි.

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් යෝජනා කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී එම්.ඩබ් විමලසිරි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

ඉහත යෝජනාව පිළිබඳව අදහස් දැක්වූ ගරු නාගරික මන්ත්‍රී නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා සඳහන් කලේ මේ සම්බන්ධව ගරු සභාපතිතුමා සමඟද සාකච්ඡා කළ බවත්, එම එළිමහන් ව්‍යායාම උපකරණ කට්ටලය සබරගමුව විශ්ව විද්‍යාලයේ ක්‍රීඩා අධ්‍යක්ෂකතුමා මැදිහත්වී

ලබා ගැනීමට අවශ්‍ය සහයෝගය ලබා දෙනු ඇති බවත්, එම ස්ථානයට මෙම පහසුකම ලබාදුන හොත් අංගසම්පූර්ණ බවට පත්වන බවත්ය.

ගරු සභාපතිතුමන් පැවසුයේ ළමා උද්‍යානය අසල ඉදිකර ඇති භූමි කොටසේ ක්‍රීඩා උපකරණ සවිකිරීම වෙනුවෙන් ප්‍රතිපාදන වෙන් වී ඇති බව ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටුවේදී සාකච්ඡා වූ බවත්, ඒ අනුව එම ස්ථානය ඉහත යෝජනාව සඳහා යොදා ගැනීමේ හැකියාව පිළිබඳව තවදුරටත් සොයා බැලීමට සිදුවන බවත්, සභාව සමඟ නඩු කටයුත්තක් පවතින ක්‍රීඩා පිටිය අසළ  භූමි කොටස සභාව වෙත පවරාගැනීමක් සිදු කළ විට ඉහත යෝජනාව එම ඉඩම් කොටසේ ක්‍රියාත්මක කිරීමට හැකියාව ලැබෙනු ඇති බවත්ය.

**07:03:02** මහජන ක්‍රීඩාංගනය වටා ඇති කුළුණු වල සවිකර ඇති හැලජන් විදුලි බුබුළු ඉවත් කර LED විදුලි බුබුළු සවිකිරීමට යෝජනා කරමි.

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් යෝජනා කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී ඩබ්.එම්.එම්.බී බණ්ඩාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

ගරු නාගරික මන්ත්‍රී නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා ඉහත යෝජනාව පිළිබඳව අදහස් දක්වමින්, දැනට මහජන ක්‍රීඩාංගනය වටා ඇති කුළුණු වල සවිකර ඇති හැලජන් විදුලි බුබුළු ඉවත් කර LED විදුලි බුබුළු සවිකිරීම මඟින් විදුලිය ඉතිරි කර ගැනීමක් සිදු කළ හැකි බවත්, එමඟින් වැය කිරීමට සිදුවන පිරිවැය අවම කිරීමක් කළ හැකි බවත් පවසන ලදී.

ගරු සභාපතිතුමා අදහස් දක්වමින් පැවසුයේ මෙම ස්ථානයේ විදුලි බුබුළු මඟින් ආවරණය වන්නේ ක්‍රීඩා පිටියේ එක් අර්ධයක් පමණක් බවත්, තවත් විදුලි කුළුණු කිහිපයක් සවිකර ක්‍රීඩා පිටියම ආවරණය වන පරිදි සැකසිය හැකි බවට නිරීක්ෂණය කළ බවත්, ඒ අනුව මේ සඳහා තමන් පෞද්ගලික අනුග්‍රහයක් ලබා ගැනීමට සාකච්ඡා කරමින් පවතින බවත්, ඉදිරියේදි එසේ අනුග්‍රයක් නොමැති වුවහොත් සභා අරමුදල් වලින් හෝ මෙය ක්‍රියාත්මක කළ යුතු බවත්ය.

**ඒ අනුව විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**07:04 ගරු නාගරික මන්ත්‍රිනි සුනේත්‍රා ඩී.වීරසිංහ මැතිතුමිය**

**07:04:01** ඕලුගංතොට රෝහලේ කාන්තා වැසිකිළිවල තත්වය ඉතා ශෝචනීය බැවින් ඒවා නැවත ප්‍රතිසංස්කරණය කිරීමට යෝජනා කරමි.

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් යෝජනා කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී එම්.ඩබ් විමලසිරි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

ගරු නාගරික මන්ත්‍රීනී සුනේත්‍රා ඩී.වීරසිංහ මැතිතුමිය සඳහන් කලේ බළන්ගොඩ රෝහලේ කාන්තා වැසිකිළිවල සමහර දොරවල් නොමැති බවත්, උපකරණ ඉතාම අබලන් වී බවත්, රෝගීන්ට භාවිතා කළ නොහැකි මට්ටමටම විනාශ වී ඇති බවත්, එබැවින් මේ පිළිබඳව සොයාබලා සිදු කළයුතු අළුත්වැඩියාවන් සිදු කිරීමට අවශ්‍ය මැදිහත්වීම ලබා දෙන ලෙසයි.

ගරු සභාපතිතුමා පැවසුයේ ඉහත යෝජනාව සම්බන්ධව සභාවෙන් සිදු කළ හැකි වන්නේ රෝහල් සංවර්ධන කමිටුව දැනුවත් කිරීම බවයි.ගරු නාගරික මන්ත්‍රී එච්.ඒ.එච්.එන් හෙට්ටිආරච්චි මැතිතුමා සඳහන් කලේ මෙය ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටුව වෙත යොමු කිරීම සුදුසු බවයි.

නගර සභා සීමාව තුළ මහජන සනීපාරක්ෂාව සම්බන්ධව සභාව මැදිහත්විය යුතු බවත්, ආයතන වල සනීපාරක්ෂාව ආදි කරුණු වලදී යම් යම් අඩුපාඩු සිදුවන්නේ නම් එම අඩුපාඩු නිවරදි කිරීමට සභාව මඟින් එකී ආතන දැනුවත් කළ යුතු බවත් ඒ අනුව රෝහල් සංවර්ධන කමිටුව දැනුවත් කළ යුතු බවත්, ගරු නාගරික මන්ත්‍රී එම්.ටී.එම් රුමි මැතිතුමා පැවසීය.

ගරු සභාපතිතුමා පැවසුයේ ඉහත සාකච්ඡා වූ පරිදි මේ පිළිබඳව රෝහල් සංවර්ධන කමිටුව සහ ප්‍රාදේශීය සංවර්ධන කමිටුව වෙත යොමු කිරීමය කටයුතු කරන බවයි.

**07:04:02** බළන්ගොඩ නගරයේ බස්නැවතුම්පල ඉතාම අපිරිසිදු වී ඇති හෙයින් ඒ සඳහා ක්‍රියාමාර්ගයක් ගැනීමට යොජනා කරමි.

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් යෝජනා කරන ලදුව ගරු නාගරික මන්ත්‍රීනී පී.කේ.එන්.ටී.ඩී සමරසේකර මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී.

ඉහත යෝජනාව පිළිබඳව අදහස් දැක්වූ ගරු නාගරික මන්ත්‍රීනී සුනේත්‍රා ඩී.වීරසිංහ මැතිතුමිය පැවසුයේ බස් නැවතුම්පොළ සෑම තැනකම පාහේ මුළුවල බුලත් විට කෙළ ගසා අපවිත්‍ර කර ඇති බවත්, ඉතාම අපිරිසිදු තත්වයට පත්ව ඇති බවත්, නීතිමය ක්‍රියාමාර්ග ගෙන හෝ එසේ අපවිත්‍ර කරන පුද්ගලයන්ට එරෙහිව ක්‍රියාකළ යුතු බවත්, බස් නැවතුම්පොලේ ඇති වී තිබෙන තත්වය හේතුවෙන් බළන්ගොඩ යන නාමයටත් ඉතා කැළලක් බවත්, හැකි ඉක්මනින් මේ සම්බන්ධව ගත යුතු ක්‍රියාමාර්ග ගන්නා ලෙසත්ය.

මේ සම්බන්ධව කරුණු සාකච්ඡා කිරීම වෙනුවෙන් ගරු සභාපතිතුමාගේ යෝජනාවෙන් සහ ගරු නාගරික මන්ත්‍රී කේ.ජී පේමදාස මැතිතුමාගේ ස්ථිරත්වයෙන් මහ සභාව කාරක සභාවක් බවට පත් කරන ලදී.

ඉහත කාරණය සම්බන්ධව මහජන සෞඛ්‍ය පරීක්ෂක මහතාගේ කරුණු පැහැදිලි කිරීමෙන් අනතුරුව ගරු සභාපතිතුමාගේ යෝජනාවෙන් සහ ගරු නාගරික මන්ත්‍රී එච්.ඒ.එච්.එන් හෙට්ටිආරච්චි මැතිතුමාගේ ස්ථිරත්වයෙන් මහ සභාව කාරක සභාවක් බවට පත් කරන ලදී.

**ඒ අනුව විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**07:04:03** බළන්ගොඩ නගරයේ ප්‍රධාන ක්‍රීඩා පිටියේ ජලය බැස යන කාණු පද්ධතිය කපා ජලය බැහැර කිරීමට හැකි ආකාරයට සකසා දෙන ලෙස යෝජනා කරමි.

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාගත කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

ඉහත ඉදිරිපත් කර ඇති යෝජනාව පිළිබඳ අදහස් දැක්වූ ගරු නාගරික මන්ත්‍රීනී සුනේත්‍රා ඩී.වීරසිංහ මැතිතුමිය සඳහන් කලේ මෙය කාලයක් තිස්සේ පවතින ගැටළුවක් බවත්, වැසි කාලය එළඹීමේදී මෙම ස්ථානය එරෙන බැවින් ජේ.සී.බී යන්ත්‍රය යොදවා කැපීමට නොහැකි බැවින් කඩිනම් කළ යුතු බවත්, නගරයේ පාසල් පද්ධතියම ක්‍රීඩා කටයුතු සඳහා භාවිතා කරන බැවින් මෙම අවස්ථාවේ මෙය සකස් කිරීම වැදගත් බවත්, අවම වශයෙන් කාණුටික කපා ජලය බැස යන පරිදි සකස් කිරීම හෝ කළ යුතු බවත්ය.

ගරු සභාපතිතුමා පැවසුයේ තමන්ද එය නිරීක්ෂණය කළ බවත්, බෝක්කු දෙකක් දෙපස සකස් කර ඇති බවත්, කෙසේ වුවද සකසා ඇති ආකාරයෙන් ජලය බැස යාම සිදු නොවන බවත්ය.ගරු නාගරික මන්ත්‍රී නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා පැවසුයේ ක්‍රීඩා පිටියේ කාණුව කපා ඇති ගැඹුර වැඩි බවත්, එම කාණුව බෝක්කු දෙකේ ප්‍රමාණයට පුරවා ජලය බැස යන ආකාරයට සකස් කළ යුතු බවයි.ගරු නාගරික මන්ත්‍රී එස්.යූ.සී ජයනක මැතිතුමා පැවසුයේ ක්‍රීඩා පිටියේ තණකොළ කැපීම තැනින් තැන කර ඇති බවයි.

ඒ අනුව ගරු සභාපතිතුමා ඉහත අඩුපාඩු නිවරදි කිරීමට කාර්මික නිලධාරී මහතා වෙත උපදෙස් ලබා දෙන ලදී.තණකොළ කපන යන්ත්‍රයක් ලබා ගැනීමට මින් පෙර සභා වාරයකදී අනුමත කරගත් බවත් ඒ අනුව එහි වර්තමාන තත්වය කුමක්ද යන්න ගරු නාගරික මන්ත්‍රී නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා විසින් විමසන ලදී.

ක්‍රීඩා පිටියේ ප්‍රේක්ෂකාගාරය අත්‍යාවශ්‍ය අංග වන වැසිකිළි පද්ධතිය සඳහා විධිමත් නඩත්තුවක් සිදු කර ගැනීමක් කළ යුතු බවත්, ඉදිරියේදී ප්‍රේක්ෂකාගාරය සංවර්ධනය කිරීමට සැලසුම් පැවතියද දැනට ඉහත කී අළුත්වැඩියාවන් අත්‍යාවශ්‍ය බවත් ගරු නාගරික මන්ත්‍රී ඩබ්.එම්.එම්.බී බණ්ඩාර මැතිතුමා පවසන ලදුව ගරු සභාපතිතුමා පැවසුයේ ප්‍රේක්ෂකාගාරයේ තීන්ත ආලේපන කටයුතු පසුගිය දිනෙක සේනක සමූහ ව්‍යාපාරයේ අනුග්‍රහයෙන් සිදු කළ බවත්, අනෙකුත් අළුත්වැඩියා සිදු කළ යුතුව පවතින බවත්ය.

ගරු නාගරික මන්ත්‍රී එච්.ඒ.එච්.එන් හෙට්ටිආරච්චි මැතිතුමා සඳහන් කලේ සේනක සමූහ ව්‍යාපාරික මහතාගෙන් අනුග්‍රහයක් සඳහා ඉල්ලීමක් කර ඉහත ප්‍රේක්ෂකාගාරයේ වැසිකිළි පද්ධතිය අළුත්වැඩියා කර ගත හැකි බවයි.

ගරු නාගරික මන්ත්‍රීනී සුනේත්‍රා.ඩී වීරසිංහ මැතිතුමිය සඳහන් කලේ බළන්ගොඩ ව්‍යාපාරික ප්‍රජාව ගෙන්වා මේ පිළිබඳව දැනුම් දී අනුග්‍රහයක් ලබා ගැනීම සුදුසු බවයි.ගරු නාගරික මන්ත්‍රී එච්.ඒ.එච්.එන් හෙට්ටිආරච්චි මැතිතුමා පැවසූයේ ඉහත සේනක මහතා වෙත ස්තුති ලිපිය පලකිරීමේදී ඉහත අනුග්‍රහය ලබා දෙන ලෙස ඉල්ලීමත් යොමු කිරීමට යෝජනා කරන බවයි.

**ඒ අනුව විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනා ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**07:04:04** බළන්ගොඩ උඩකන්ද පාර ඉතා පටු මාර්ගයක් බැවින් එම පාර පළල් කර නැවත ප්‍රතිසංස්කරණය කිරීමට යෝජනා කරමි.

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් යෝජනා කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී එම්.ඩබ් විමලසිරි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**ඒ අනුව විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**07:04:05** නගරයේ බස්නැවතුම්පල අලුතෙන් ඉදිකළ කඩකාමර විශාල ප්‍රමාණයක් වසා ඇති හෙයින් ඒ සම්බන්ධයෙන් ක්‍රියා මාර්ගයක් ගන්නා ලෙස යෝජනා කරමි.

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් යෝජනා කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී එම්.ඩබ් විමලසිරි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

ගරු සභාපතිතුමා සඳහන් කලේ මේ සම්බන්ධව තමන් සොයා බැලූ බවත්, කඩ කාමර වසා තිබුනද ඒවායේ බදුකරුවන් සිටින බවත්, නියමිත පරිදි කුලී මුදල් ලැබෙන බවත්, දැනට නව පදික කඩ දෙකක් පමණක් කුලී නොගෙවීම හේතුවෙන් වසා දමා පවතින බවත්ය.ගරු නාගරික මන්ත්‍රීනී සුනේත්‍රා ඩී.වීරසිංහ මැතිතුමිය සඳහන් කලේ සභාවෙන් කඩ කාමර බදු ලබාගෙන එසේ වසා දමා කුලිය ගෙවීම පමණක් සිදු කළ හැකිද යන්නත්, ඒ පිළිබඳව ගිවිසුමේ කුමක් සඳහන්ද යන්නත්ය.ගරු සභාපතිතුමා පැවසූයේ එසේ වසා දමා පවතින කඩ කාමර පවතී නම් ඒවා පිළිබඳව සොයා බලන බවයි.

**07:04:06** බළන්ගොඩ නගර සභාව තුල පවත්වාගෙන යනු ලබන යහසාධක සංගමය සඳහා කැමති මන්ත්‍රීවරුන් බඳවා ගැනීමට යෝජනා කරමි.

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් යෝජනා කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී ඩබ්.එම්.එම්.බී බණ්ඩාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.**ඒ අනුව විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

ගරු නාගරික මන්ත්‍රී නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා පැවසුයේ සභාවේ සියළුම සේවක මහත්ම මහත්මීන් සමඟ විනෝද චාරිකාවක් යෑමට ජනවාරි මස කටයුතු සූදානම් කර පැවතියද ජනවාරි මස එයට අවස්ථාව නොලැබුන බැවින් එය කඩිනම් කළ යුතු බවයි.ඉහ. ඉදිරිපත් කළ යෝජනා සියල්ලම ඉතා ඉක්මනින් ක්‍රියාත්මක කළ යුතු බව ගරු නාගරික මන්ත්‍රීනී සුනේත්‍රා ඩී.වීරසිංහ මැතිතුමිය පැවසීය.

ගරු සභාපතිතුමා පැවසුයේ ඊළඟ සභා වාරයේ සිට ඊට පෙර පැවති සභාවේ යෝජනාවල ප්‍රගතිය සලකා බැලීමක් සිදු කළ යුතු බවයි.

**07:05** ගරු නාගරික මන්ත්‍රී එන්.ඒ.එස් චන්දන මැතිතුමා

**07:05:01** බළන්ගොඩ බස් නැවතුම්පොළ ගුවන් පාලමේ සවිකර ඇති දැන්වීම් පුවරු වලින් සභාවට ලැබෙන ආදායම අඩු බැවින් එය ඩිජිටල් පුවරුවක් ලෙස සංවර්ධනය කිරීමට බාහිර පාර්ශවයක් වෙත ලබා දීමට යෝජනා කරමි.

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් යෝජනා කරන ලදුව ගරු නාගරික මන්ත්‍රීනී සුනේත්‍රා ඩී.වීරසිංහ මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී.

ඉහත යෝජනාව පිළිබඳ අදහස් දැක්වූ ගරු නාගරික මන්ත්‍රී ඩබ්.එම්.එම්.බී බණ්ඩාර මැතිතුමා අදහස් දක්වමින් පැවසුයේ ගුවන් පාලම දෙපස ඩිජිටල් පුවරු ලෙස සංවර්ධනය කිරීමට අපේක්ෂා කරනු ලබන බවත්, එහි පවතින නීතිමය තත්වය පිළිබඳව සලකා බලා හැකියාවක් පවතීනම් එම යෝජනාව ක්‍රියාත්මක කිරීම පිළිබඳව සලකා බලන ලෙසත් පවසන ලදී.

එම ස්ථානයේ ඩිජිටල් පුවරු සවිකිරීමේ ඇති හැකියාව පිළිබඳව කරුණු සාකච්ඡා කිරීම සඳහා ගරු සභාපතිතුමාගේ යෝජනාත්වයෙන් සහ ගරු නාගරික මන්ත්‍රී එම්.නිමල් කරුණාරත්න මැතිතුමාගේ ස්ථිරත්වයෙන් මහ සභාව කාරක සභාවක් බවට පත් කරන ලදී.

අදාළ කරුණු සාකච්ඡා කිරීමෙන් පසු කාරක සභාව මහ සභාව බවට පත් කිරීමට ගරු සභාපතිතුමා යෝජනා කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී ඩබ්.ඩී වසන්ත කුමාර මැතිතුමා එකී යෝජනාව ස්ථිර කරන ලදී.

**08.** කාරක සභා වාර්තා සලකා බැලීම

2026-02-09 සහ 2026-02-27 යන දිනයන්හි පැවති මුදල් කාරක සභා වාර්තා මෙදින ගරු සභාවට ඉදිරිපත් කළ අතර විරෝධතා නොවූ හෙයින් එකී වාර්තා ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.

**09. ආදායම් වියදම් වාර්තා සලකා බැලීම**

**2026 ජනවාරි මස ආදායම් වියදම් වාර්තාව**

| | |
|---|---|
| පුනරාවර්තන ලැබීම් | රු.19,757,141.72 |
| මූලධන ලැබීම් | රු.2,986,941.27 |
| වෙනත් ලැබීම් | රු.3,025,314.73 |
| මුළු ලැබීම් | රු.25,769,397.72 |
| පුනරාවර්තන වියදම් | රු.8,815,729.35 |
| වෙනත් වියදම් | රු.13,723,128.46 |
| මුළු වියදම් | රු.22,538,857.81 |

**2026 පෙබරවාරි මස ඉන්ධන වාර්තාව**

| **2026 පෙබරවාරි ඉන්ධන වාර්තාව** | |
|---|---|
| වාහන අංකය | මුදල (රු) |
| 226-7521 | 13,851.94 |
| 227-5020 | 79,021.60 |
| 56-1906 | 17,175.11 |
| BC 0005 | 39,960.00 |
| DPP 0006 | 33,540.00 |
| GC 0001 | 19,020.00 |
| GK 1483 | 85,452.21 |
| HF 7899 | 65,734.77 |
| HF 8558 | 20,673.55 |
| JD 4684 | 1,460.00 |
| MM 8152 | 1,460.00 |
| ND 5124 | 45,170.94 |
| PF 4006 | 34,626.39 |
| RC 1107 | 38,654.54 |
| RC 1118 | 28,255.39 |
| RD 8000 | 12,743.94 |
| RD 8240 | 80,891.76 |
| ZA 5039 | 11,500.00 |
| LL 7688 | 25,484.00 |
| DDR 0008 | 1,556.27 |
| UQ 1933 | 2,006.04 |
| ZA 9835 | 98,686.11 |
| HF 8952 | 22,973.55 |
| VI 1833 | 584.00 |
| PRIMIX | 36,400.00 |
| **TOTAL** | **816,882.10** |

මෙදින සභාවට ඉදිරිපත් කරන ලද ආදායම් වියදම් වාර්තා හා ඉන්ධන වාර්තා සඳහා විරෝධතා ඉදිරිපත් නොවූ හෙයින් ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.

**10. පෞද්ගලික මන්ත්‍රී පැහැදිලි කිරීම්**

**ගරු නාගරික මන්ත්‍රී නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා**

ගරු නාගරික මන්ත්‍රී නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා අදහස් දක්වමින්, පොලේ අනවසර පදිංචිකරුවන් සිටින බවත්, එම පුද්ගලයන් ඉවත් කිරීම සම්බන්ධව තීරණයක් ගෙන තිබේද යන්නත්, මතුපිටින් පේන දේට වඩා දෙයක් එම ස්ථානවල සිදුවන බවත්, නගරයේ මත්ද්‍රව්‍ය සම්බන්ධ ක්‍රියා මෙන්ම අපචාර

සම්බන්ධ ක්‍රියා එම ස්ථානවල සිදුවන බවත්, අනිවාර්යෙන්ම අධිකරණ නියෝගයක් රැගෙන හෝ මෙම පිරිස ඉවත් කිරීමට කටයුතු සිදු කළ යුතු බවත් පවසන ලදී.ගරු නාගරික මන්ත්‍රී එච්.ඒ.එච්.එන් හෙට්ටිආරච්චි මැතිතුමාද සඳහන් කලේ මේ සම්බන්ධව පසුගිය සභා වාරයක තීරණයක් ලබා ගත් බවත්, ඒ අනුව අදාළ ආයතන දැනුවත් කර එම තීරණ ක්‍රියාත්මක කළ යුතු බවත්ය.

**ගරු නාගරික මන්ත්‍රී ඩබ්.එම්.එම්.බී බණ්ඩාර මැතිතුමා**

ගරු නාගරික මන්ත්‍රී ඩබ්.එම්.එම්.බී බණ්ඩාර මැතිතුමා අදහස් දක්වමින්, සභාවේ චේන්සෝ යන්ත්‍රය සහ භාණ්ඩ සමීක්ෂණ වාර්තාව සම්බන්ධ ගැටළුව බරපතල කාරණාවක් බවත්,එම වාර්තාවල සඳහන් නොවන යන්ත්‍රයක් නඩත්තුවකට යොමු කිරීමත් ගැටළු සහගත බවත්, ඒ සම්බන්ධ පරීක්ෂණයක් සිදුකළ යුතු බවත්, එමෙන්ම ඉදිරි උත්සව සමය සඳහා නගරය ලෙස සභාවේ සූදානම කුමක්ද යන්න පිළිබඳව අවබෝධයක් තිබිය යුතු බවත්, ගරු නාගරික මන්ත්‍රී එම්.නිමල් කරුණාරත්න මැතිතුමාගේ අභියෝගතා කුසලාන පාපැදි තරඟාවලිය සඳහා සියළු දෙනා සහයෝගය ලබා දිය යුතු බවත් පවසමින් එතුමාගේ අදහස් දැක්වීම අවසන් කරන ලදී.

**ගරු නාගරික මන්ත්‍රී එම්.ඩබ් විමලසිරි මැතිතුමා**

ගරු නාගරික මන්ත්‍රී එම්.ඩබ් විමලසිරි මැතිතුමා අදහස් දක්වමින් පැවසූයේ, මේ වන විට කාරක සභාවලින් ක්‍රියාත්මක වන්නේ මුදල් කාරක සභාව පමණක් බවත්, අනෙකුත් කාරක සභා ක්‍රියාත්මක නොවන බැවින් හැකි ඉක්මනින් එම කාරක සභාවන් පැවැත්විය යුතු බවත්ය.

**ගරු නාගරික මන්ත්‍රීනී සුනේත්‍රා ඩී.වීරසිංහ මැතිතුමිය**

ගරු නාගරික මන්ත්‍රීනී සුනේත්‍රා ඩී.වීරසිංහ මැතිතුමිය අදහස් දක්වමින්, සභාව පත්වී දැනට මාස 10ක් ගතවී ඇති බවත්, නමුත් තවමත් එහි නඩත්තු කටයුතු සිදු වී නොමැති බවත්, එහි පවතින පැරණි සොහොන් කොත් ඉවත් කිරීමට කටයුතු කළ යුතු බවත් පවසන ලදී.ගරු සභාපතිතුමා පැවසූයේ සභාව මට්ටමින් සිදු කළ හැකි නඩත්තු මේ වන විට සිදු කර ඇති බවත්, දැව සංස්ථාව මඟින් ඉවත් කළ යුතු ගස් පවතින බවත්, එම ආයතනය සඳහා නැවත දැනුම් දීමක් යොමුකරන බවත්ය.

**ගරු නාගරික මන්ත්‍රී එස්.යූ.සි ජයනක මැතිතුමා**

ගරු නාගරික මන්ත්‍රී එස්.යූ.සි ජයනක මැතිතුමා අදහස් දක්වමින් පරණ පාර කේ.එම්.ජේ ආයතනය ඉදිරිපිට කොන්ක්‍රීට් ලැලි කිහිපයක් කැඩී පවතින බවත්, ඉදිරියට වර්ෂා කාලයක් වුවහොත් ජලය

බැසයාමේ ගැටළු ඇති විය හැකි බවත්, එම ස්ථානයේ පමණක් නොව නගරයේ බොහෝ ස්ථානවල මෙම ස්ලැබ් කැලි කඩා වැටී ඇති ගැටළුව පවතින බවත්, ඉදිරි උත්සව සමයේ විශාල ලෙස ජනතාව නගරය කරා එන බැවින් කඩිනමින් ඒ සඳහා පියවර ගත යුතු බවත්, සභාවේ ජ්‍යෝෂ්ඨ මන්ත්‍රීවරයෙක් වන ගරු නාගරික මන්ත්‍රී එම්.නිමල් කරුණාරත්න මැතිතුමාගේ පාපාදි තරඟාවලිය සඳහා සභාවේ සියළු මන්ත්‍රීතුමන්ලාගේ සහයෝගය ලබා දෙමු යන යෝජනාවත් කරමින් එතුමාගේ අදහස් දැක්වීම අවසන් කරන ලදි.

**ගරු නාගරික මන්ත්‍රී ඩබ්.ඒ වසන්ත ගුණරත්න මැතිතුමා**

ගරු නාගරික මන්ත්‍රී ඩබ්.ඒ වසන්ත ගුණරත්න මැතිතුමා අදහස් දක්වමින් සෑම සභා වාරයක සේම අදදිනයේත් සභාවේ නිලධාරින සමඟ පැටලීමක් ඇති කර ගත් බවත්, කුමන හෝ කාරණාවක් මුල් කර ගනිමින් එලෙස සිදුවන බවත්, ඒ පිළිබඳව කණගාටු වන බවත්, මන්ත්‍රීතුමන්ලා එය දැනගත යුතු බවත්, නිලධාරිනුත් වැඩ කිරීමේදී එය අවබෝධ කරගත යුතු බවත්, ඉදිරිපත් කරන යෝජනා සියල්ලම මෙම සභාවේ මින් පෙර සභාවන්වලදී ඉදිරිපත් කළ යෝජනා බවත්, ඒවායින් නව අදහසක් තවම නොලැබුන බවත්, පවතින නීතිමය රාමුව තුළ වැඩ කිරීමේදි ප්‍රායෝගික විය යුතු බවත්, පළාත් පාලන ආයතනයේ රාමුවට ඔබ්බෙන් වැඩ කළ බැවින් හිටපු ගරු සභාපති ඩබ්.එම්.ජී වීරසිංහ මැතිතුමාගේ පාලන කාලයේ නගරයට සිදුකළ සංවර්ධනයන් තවමත් පෙනෙන්නට තිබෙන බවත් පවසන ලදී.

එතුමා වැඩිදුරටත් අදහස් දක්වමින් පැවසුයේ තමන් තරම් ඝණ අපද්‍රව්‍ය කළමණාකරණය සම්බන්ධයෙන් විදේශගතවීමට හැකියාව ලැබූ තවත් අයෙකු නොමැති තරම්බවත්, අදදින සභාවේ ඉදිරිපත් කළ කීට ව්‍යාපෘති මීට පෙර මෙහි සිදුකර ඇති නමුත් ඒවා සාර්ථක නොවූ බවත්, නමුත් ඊට විරුද්ධව අදහස් දැක්වූවානම් එම ව්‍යාපෘතිය සිදුවනවාට අකමැත්තෙන් බවට සිතන බවත්, කසළ කළමණාකරණය සම්බන්ධව ලංකාවේ පළාත් පාලන ආයතන පුහුණුවක් ලබා ගත්තේ බළන්ගොඩ නගර සභාවෙන් වුවද දැන් එය හාත්පසින් වෙනස් වී වෙනත් ආයතන මඟින් මෙම සභාව පුහුණුවට යන බවත්, එමෙන්ම මෙලෙස නිලධාරීන් සමඟ ගැටීමට ගිය විට සිදුවන්නේ සභාව වැරදි තැනකට යොමුවන බවත්, වර්තමාන බලය ලබාගත් සභා කණ්ඩායම මෙය ලබා ගත්තේද විශාල වැඩ කොටසක් සිදු කිරීමට බවත්, නමුත් මෙහි ප්‍රායෝගික ගැටළු පවතින බැවින් වැඩ කිරීම ඉතා අසීරු බවත්, 1994 සිට 2018 පමණ වන තෙක් මෙහි මන්ත්‍රීවරුන් ඡන්දය රැගෙන ගියද නිලධාරින් වැඩ කළ බවත්, නමුත් ලංකාවේ උඩින්ම පවතින පළාත් පාලන ආයතනයක් ලෙස මෙම ආයතනය පැවැති බවත්, බොහෝ තැන්වල මන්ත්‍රීතුමන්ලාට අවශ්‍ය නොවන කාරණාවලට අතපත ගැමට යන බැවින් ගැටළු ඇති වන බවත්, වැරදි වංචා සිදුවනවානම් ඒවා හෙළිදරව් කිරීමට විගණනයක් පවතින බවත්, එමෙන්ම ගරු නාගරික මන්ත්‍රී එම්.නිමල් කරුණාරත්න මැතිතුමාගේ පාපැදි තරඟාවලිය සම්බන්ධව සභාවෙන් දක්වන සහයෝගයට ස්තූතිවන්ත වන බවත්, එය සභාව සඳහා කීර්තියක් ගෙන දිය හැකි පරිදි සාර්ථක

කර ගැනීමට අවශ්‍ය සහයෝගය ලබා දෙමු යන්නත් පවසමින් එතුමාගේ අදහස් දැක්වීම අවසන් කරන ලදී.

**ගරු නාගරික මන්ත්‍රී එච්.ඒ.එච්.ඒ හෙට්ටිආරච්චි මැතිතුමා**

ගරු නාගරික මන්ත්‍රී එච්.ඒ.එච්.ඒ හෙට්ටිආරච්චි මැතිතුමා අදහස් දක්වමින් පැවසුයේ ආධුනික නවක මන්ත්‍රීවරුන් ලෙස ගරු නාගරික මන්ත්‍රී කේ.ජී පේමදාස මැතිතුමා සහ ගරු නාගරික මන්ත්‍රී ඩබ්.ඒ වසන්ත ගුණරත්න මැතිතුමා වැනි ජ්‍යෙෂ්ඨ මන්ත්‍රීතුමන්ලාට ගරු කරන බවත්, තමන් රාජ්‍ය සේවයේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයක ගබඩා විෂය සම්බන්ධව රාජකාරී සිදුකරන බැවින් තමන් දන්නා දේ පිළිබඳව විමසීම් සිදු කරන බවත්, එහිදී කිසිඳු නිලධාරියෙකු ඉලක්ක කර නොගන්නා බවත්, දිට්වා සුළි කුණාටුව පැවති කාලයේදී අනතුරුදායක ගස් ඉවත් කිරීමේදී සභාවේ චේන්සෝ යන්ත්‍රයක් අළුත්වැඩියා කටයුතු සඳහා යොමුකර ඇති බව පැවසූ බවත්, මුදල් කාරක සභාවේදී නව යන්ත්‍රයක් ගැනීමට අනුමත වූ බවත්, එබැවින් යන්ත්‍ර දෙකක් පැවතීම සහ භාණ්ඩ සමීක්ෂණය සම්බන්ධව විමසූ බවත්, මෙහි ගනුදෙනු කරනුයේ ජනතාවගේ බදු මුදල් සමඟ බැවින් මුදල් සම්බන්ධව විනිවිදභාවය තිබිය යුතු බවත්, මෙයින් ලැබෙන දීමනා මුදලක්වත් පෞද්ගලික ප්‍රයෝජනයට නොගන්නා බවත්, එය යොදවන්නේ ජනතා සේවයට බවත්, මෙහි යම් දෙයක් සිදුවන බව දැනුනු පසු ඒ පිළිබඳව ජනතා නියෝජිතයන් ලෙස විමසන බවත්, ඒ වගවීම සහ වගකීම තමන්ට පවතින බවත්, ඒ සම්බන්ධව සොයා බැලීම හෝ නොබැලීම නිලධාරීන් සතු කාර්යයක් බවත්, ඒ සම්බන්ධව විමසීමේදී යම් නිලධාරියෙකු හෝ කිසිවෙකු අපහසුතාවයට පත් වූවානම් ඒ සම්බන්ධව කණගාටු වන බවත්, සමාව ඉල්ලීය යුතු නම් ඒ සම්බන්ධව සමාව ඉල්ලන බවත් පවසමින් එතුමාගේ අදහස් දැක්වීම අවසන් කරන ලදී.

**11. අවසානය**

අද දින ගරු සභාව සාර්ථකව පවත්වා ගැනීමට සහයෝගය ලබාදුන් ගරු නාගරික මන්ත්‍රී මණ්ඩලය, කාර්ය මණ්ඩලය සහ මාධ්‍යවේදී කණ්ඩායම සඳහා ස්තූතිය පුද කරන බවත් දන්වමින් මෙදින මහ සභාවේ කටයුතු ප.ව.12.55 ට පමණ අවසන් කරන ලදි.

එන්.ඩබ්.පී.ටී ජයසේන,

සභාපති,

බළන්ගොඩ නගර සභාව.